# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,915 — 1970 ජූලි 17 වැනි සිකුරාද — 1970.7.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 503 | ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 506 |
| ගනතුරු-ඇබෑර්තු ... ... ... | 505 | අය-වැය ලේඛන ... ... ... | 510 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 505 | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | මාර්ග කොමිටි දන්වීම ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දන්වීම ... | 506 | විවිධ දන්වීම ... ... ... ... | 511 |


## පළාත් පාලන නිවේදන

### රත්තොට සුළු නගර සභාව

**සුළු නගර සභා ආඥාපනත**

### 1970 වර්ෂය සඳහා වූ කශළ ශෝධන විශේෂ වරිපනම් බද්ද

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වගන්තිය යටතේ සහ ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බල තල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ ඇමතිවරයා විසින් දෙනලද අනුමතිය ඇතිව, අතුරු ව්‍යවස්ථාවලින් නියම කල හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව, රත්තොට නගරය තුළ පිහිටි සියළුම නිශ්වල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වූ කශළ ශෝධන විශේෂ වරිපනම් බද්දක්, පිළිවෙලින් 1970 ජූනි මස 30, සැප්තැම්බර් මස 30 සහ දෙසැම්බර් මස 31 වැනි දිනයන්හි සමාන කොටස් තුනකින් ගෙවිය හැකි වන පරිදි රත්තොට සුළු නගර සභාව විසින් 1970 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. මහාදේව,
ස්ථිර ලේකම්.
රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1970. 7. 1 දින,
කොළඹ දී ය.

7–679—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## රත්තොට සුළු නගර සභාව

**සුළු නගර සභා ආඥාපනත**

### 1970 වර්ෂය සඳහා වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්ද

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වගන්තිය යටතේ සහ ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය ඇතිව, අතුරු ව්‍යවස්ථාවලින් නියම කළ හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව රත්තොට නගරය තුල පිහිටි සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දක්, පිළිවෙලින් 1970 ජූනි මස 30, සැප්තැම්බර් මස 30 සහ දෙසැම්බර් මස 31 වැනි දිනයන්හි සමාන කොටස් තුනකින් ගෙවිය හැකි වන පරිදි රත්තොට සුළු නගර සභාව විසින් 1970 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. මහාදේව,
ස්ථිර ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1970.7.1 දින,
කොළඹ දී ය.

7–683—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඞී.—බී. 80/47

## කයිට්ස් සුළු නගර සභාව

**සුළු නගර සභා ආඥාපනත**

### 1970 සඳහා වූ විශේෂ ජල බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ සහ ඒ වගන්තියෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් දෙන ලද අනුමැතිය ඇතිව, අතුරු ව්‍යවස්ථා වලින් නියම කළ හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව කයිට්ස් නගරය තුල පිහිටි සියළුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වූ විශේෂ ජල බද්දක් පිළිවෙලින් ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් තුනකින් ගෙවිය හැකි වන පරිදි කයිට්ස් සුළු නගර සභාව විසින් 1970 වර්ෂය සඳහා පනවනු ලැබූ බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. මහාදේව,
ස්ථිර ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය.

1970. 7. 1 දින,
කොළඹ දී ය.

7–678—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඞී—බී 80/47

## කයිට්ස් සුළු නගර සභාව

**සුළු නගර සභා ආඥාපනත**

### 1970 සඳහා කසල ශෝධන විශේෂ වරිපනම් බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ සහ ඒ වගන්තියෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් දෙන ලද අනුමැතිය ඇතිව, අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් සහ නිදහස් කිරීම්වලට යටත්ව, කයිට්ස් සුළු නගරය තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වූ කසළ ශෝධන විශේෂ වරිපනම් බද්දක්, පිළිවෙළින් ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් තුනකින් ගෙවා අවසන් කළ හැකි අන්දමට 1970 වර්ෂය සඳහා කයිට්ස් සුළු නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. මහාදේව,
ස්ථිර ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1970. 7. 1,
කොළඹ දී ය.

7–692—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඞී—බී 8/70

## අගලවත්ත සුළු නගර සභාව

**සුළු නගර සභා ආඥාපනත**

### 1970 වර්ෂය සඳහා දේපළ වරිපනම් බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 159 (1) වැනි වගන්තිය යටතේ සහ එකී වගන්තියෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ ඇමතිවරයා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් දෙනලද අනුමැතිය ඇතිව, අගලවත්ත සුළු නගර සභාව විසින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්, විශේෂයන් හා කොන්දේසිවලට යටත්ව, අගලවත්ත සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන කුඹුරු හැර, සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වූ වරිපනම් බද්දක්, පිළිවෙලින් ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි දී සමාන කොටස් තුනකින් ගෙවා අවසන් කළ හැකි අන්දමට 1970 වර්ෂය සඳහා අගලවත්ත සුළු නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. මහාදේව,
ස්ථිර ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1970.7.1 දින,
කොළඹ දී ය.

7–684—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

**17 (5) වගන්තිය යටතේ වූ දැන්වීමයි**

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතේ 17 (5) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් හත්තොටුව ගමගේ ආනන්ද වන මා විසින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ගම්සභාවට සභාපතිතුමෙකු තෝරා පත් කර ගැනීම සඳහා 1970 ජූලි මස 23 වෙනි දින පෙරවරු 10 ට මැදිරිගිරියේ දියසෙන්පුර පිහිටි මැදිරිගිරිය ගම්සභා කාර්යාලයේ දී සභා රැස්වීමක් මෙයින් කැඳවනු ලැබේ.

එච්. ජී. ආනන්ද,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
පොළොන්නරුව දිස්ත්‍රික්කය.

1970 ජූලි මස 6 වෙනි දින,
පොළොන්නරුවේ, පළාත් පාලන අමාත්‍යාංශ
කාර්යාලයේ දීය.

7 705—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

### ගම්සභා ආඥාපනත

**13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් තම්බිසාහිබු අයිදුරුස් කමාල්දීන් වන මම පට්ටිපොල ගම් සභාවේ අංක 7 දරණ කොට්ඨාසයේ නියෝජිත පෙරුමාල් රාමසාමි මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභා රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරාපත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව බදුල්ල දිස්ත්‍රික්කයේ පට්ටිපොල ගම්සභාවේ අංක 7 කොට්ඨාසයේ නියෝජිත පෙරුමාල් රාමසාමි මහතා මේ දැන්වීම ගැසට්පත්‍රයේ පළකිරීමේ දිනයේ සිට එම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ටී. අයි. කමාල්දීන්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
බදුල්ල.

1970.7.4 වැනි දින,
පළාත් පාලන කාර්යාලය,
බදුල්ල.

7–701—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

**17(5) වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපණතේ (257) අධිකාරයේ 17(5) දරණ වගන්තියේ මා වෙත පැවරී ඇති බලයේ ප්‍රකාර වවුනියා පළාත් පාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් කනගනායගම් නල්ලෙයිනාදන් වන මා විසින් මීට යාකොට ඇති උපලේඛණයේ I වැනි තීරුවෙන් නියමිත එක් එක් ගම්සභාවේ ප්‍රථම රැස්වීම එහි උපලේඛණයේ II වැනි තීරුවේ අනුරූප සටහනින් නියමිත දිනයන්හිදී ද එහි උපලේඛනයේ III වැනි තීරුවේ අනුරූප සටහනින් නියමිත වේලාවේද, එහි උපලේඛණයේ IV වැනි තීරුවෙන් නියමිත ස්ථානයේදී ද මෙයින් කැඳවා සිටිනු ලැබේ.

ක. නල්ලෙයිනාදන්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
වවුනියා ප්‍රදේශය.

1970 ජූලි මස 7 වැනි දින,
වවුනියාවේ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේදී ය.

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව | IV වැනි තීරුව |
|---|---|---|---|
| ගම්සභාවේ නම | දිනය | වේලාව | ස්ථානය |
| වින්නවෙඩ්ඩිකුලම් බටහිර ... | 70.7.23 ... | පෙරවරු 10.00 ... | වින්නවෙඩ්ඩිකුලම් බටහිර ගම්සභා කාර්යාලය |

7–539—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## තනතුරු – ඇබෑර්තු

### පළාත් පාලන සේවය

**කාර්යාල කාර්ය සහායක තනතුර—කපුගොල්ලෑව ගම්සභාව**

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය: වර්ෂයකට රුපියල් 540—30×8—24×1 රු. 800, රු. 636—සහ—රු. 732—යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩඉම් ඇත.

3. අවශ්‍ය සුදුසුකම්:—

(අ) වයස: 1970 ජූනි මස 1 දිනට වයස අවුරුදු 20 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල/දෙමළ 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම් වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රය IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරු වලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සරානුකූලව පිළියෙල කොට 1970 ජූලි මස 25 වෙනි දිනට හෝ ඊට පළමු කපුගොල්ලෑව ගම් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

ඇස්. ඇම්. සිරිසේන,
සභාපතිතැන,
කපුගොල්ලෑව සම්සභාව,
කපුගොල්ලෑව.

1970 ජූලි මස 1 වෙනි දින,
කපුගොල්ලෑව ගම් සභා කාර්යාලයේදීය.

7–739—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### පළාත් පාලන සේවය

**වෘත්තිය සුදුසුකම් නොලත් සහකාර ඉංජිනේරු ශ්‍රේණියට විදුලිය හා කර්මාන්ත උසස් කිරීමේ විභාගය**

1970 ජනවාරි පළමුවැනි දින සිට ඉහත සඳහන් විභාගයට අපේක්ෂකයින් ඉදිරිපත් නොකිරීමට ගෙන ඇති තීරණය අවලංගු කිරීමට පළාත් පාලන සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

1968.8.16 දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළමු නිවේදනය මින් අවලංගු කරනු ලැබේ.

ඩී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ජූලි මස 8 දින,
තැ. පෙ. 530, කොළඹ.

7–708—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

### පළාත් පාලන සේවය

**I, II, III වැනි ශ්‍රේණීන්හි කර්මාන්ත/ජලකර්මාන්ත අධිකාරීන්, කොළඹ නාගරික සභාවේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ හා ජල කර්මාන්ත දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරුන්ගේ, අනෙකුත් ප්‍රාදේශීය බලමණ්ඩලවල ජලකර්මාන්ත පරීක්ෂකවරුන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය—1969.9.9 සිට 1969.9.14 දක්වා**

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල ප්‍රසිද්ධ කරන ලද 70.5.22 දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ නිවේදනයට වැඩි දුරටත් ය. පහත නම් සඳහන් අය ද නම ඉදිරියෙන් දී ඇති ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කර ඇති බැව් මෙයින් දන්වනු ලැබේ:—

1. එස්. කුලසිංහම්—පළමුවැනි ශ්‍රේණියේ කර්මාන්ත අධිකාරී.
2. කේ. කුමාරදේවන්—තුන්වැනි ශ්‍රේණියේ ජලකර්මාන්ත අධිකාරී.
3. එම්. ඩබ්. සී. ද සිල්වා—තුන්වැනි ශ්‍රේණියේ කර්මාන්ත අධිකාරී.

ඩී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ජූලි මස 7 දින,
තැ. පෙ. 530,
කොළඹ.

7–706—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

# පලාත් පාලන සහා ජනද ආඥපණත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

### (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ (262 වැනි අධිකාරය වන) 36 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයන් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රදේශීය බලමණ්ඩල).

1970 ජූලි මස 6 වැනි දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

කොට්ඨාශ අංකය. — අපේක්ෂකයාගේ නම

**කළුතර දිස්ත්‍රික්කය**
**බේරුවල්-අලුත් ගම්-මාලෙවන් බද්ද ගම්සභාව**

7. ... ... දොඩන්ගොඩ ආරච්චිගේ ආරියනන්ද

**නුවරඑළිය දිස්ත්‍රික්කය**
**පල්ලේපනේ ගම් සභාව**

10. ... දසනායක මුදියන්සේලාගේ පුංචිබණ්ඩා දසනායක

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
**මෙදනිවත්ත ගම් සභාව**

4. ... ... සෙල්වරාසා සෝමසුන්දරම්

**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**ගලෙන්බිඳුනුවැව ගම් සභාව**

18. ... ... රංගා වෙල්පණික්කියාගේ කපුවා

7–713—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## රක්වාන සුළු නගර සභාව

### 1968 වර්ෂයේ ආදයම් හා වියදම් ප්‍රකාශය

**ආදයම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදයම ... ... | | 44,426 60 |
| බී.—මංමාවත් ... ... | | 1,606 0 |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | | 3,165 96 |
| ඩී.—මහජන සෞඛ්‍යය ... ... | | 21,301 75 |
| ඊ.—ම ජන නෝදය ... ... | | 9 0 |
| ජී.—සුණඛ ඝාතනය ... ... | | — |
| ජේ.—කියවීම්ශාලා සහ පුස්තකාල ... | | 500 0 |
| | | 71,009 31 |
| **වෙනත් ලැබීම්** | | |
| තැන්පත් (සාමාන්‍ය විදුලිය) ... | 6,127 28 | |
| ජයේ ආධාර ... ... | 5,000 0 | |
| | | 11,127 28 |
| අත්තිකාරම් ... ... | | 15,663 57 |
| **ආදයම් එකතු කිරීමේ ගිණුම** | | |
| දේපල බදු ... ... | 5,707 07 | |
| වතුර බදු ... ... | 2,545 29 | |
| කසල බදු ... ... | 4,151 64 | |
| වරිපනම් දඩ ... ... | 169 30 | |
| විදුලිබල ගාස්තු ... ... | 29,505 44 | |
| | | 42,078 74 |
| විවිධ ණය ගැතියෝ ... ... | | 8,102 09 |
| විවිධ ණය හිමියෝ ... ... | | 17,896 54 |
| විදුලිය ගිණුම ... ... | | 50,703 79 |
| 67.12.31 දිනට මුදල් ශේෂය ... | | 29,118 45 |
| | | 245,699 77 |

**වියදම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... ... | | 23,854 60 |
| බී.—මංමාවත් ... ... | | 8, 73 24 |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | | 2,533 05 |
| ඩී.—මහජන සෞඛ්‍යය ... ... | | 42,22ı 14 |
| ඊ.—මහජන විනෝදය ... ... | | — |
| ජී.—සුණඛ ඝාතනය ... ... | | 469 50 |
| ජේ.—කියවීම්ශාලා සහ පුස්තකාල ... | | 382 40 |
| | | 77,733 93 |
| **වෙනත් ගෙවීම්** | | |
| තැන්පත් (සාමාන්‍ය හා විදුලිය) ... | 6,708 05 | |
| රජයේ ආධාර ... ... | 5,652 15 | |
| | | 12,360 50 |
| අත්තිකාරම් ... ... | | 17,395 35 |
| **ආදයම් එකතු කිරීමේ ගිණුම** | | |
| දේපල බදු ... ... | 5,742 25 | |
| වතුර බදු ... ... | 2,635 26 | |
| කසල බදු ... ... | 4,273 74 | |
| වරිපනම් දඩ ... ... | 100 09 | |
| විදුලිබල ගාස්තු ... ... | 29,942 85 | |
| | | 42,694 19 |
| විවිධ ණය ගැතියෝ ... ... | | 9,821 36 |
| විවිධ ණය හිමියෝ ... ... | | 4,416 81 |
| විදුලිය ගිණුම ... ... | | 51,757 54 |
| 68.12.31 දිනට මුදල් ශේෂය ... | | 29,520 39 |
| | | 245,699 77 |

රක්වාන සුළු නගර සභාවේ සභාපති, වේලාතත්තිරි ගුරුනාන්සේලාගේ කරුණාරත්න වන මම ඉහත සඳහන් ප්‍රකාශය මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1968 දෙසැම්බර් 31 වෙනි දිනට රක්වාන සුළු නගර සභාවේ ආදයම් හා වියදම් පිළිබඳව නිවැරැදිවූත්, සත්‍යවූත්, ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

වී. ටී. ජී. කරුණාරත්න,
රක්වාන සුළු නගර සභාවේ සභාපති.

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරැදි බවට සහතික කරමි.

කේ. ඩී. ඒඩින් අප්පුහාමි,
අංක. 3 කොට්ඨාශයේ සභික—රක්වාන සුළු නගර සභාව.

1970 ක්වූ පෙබරවාරි මස 24 වෙනි දින රක්වානේදී මා ඉදිරිපිට අත්සන්කර දිවුරුම්දුන් බවට සහතික කරමි.

කේ. සහාරත්නම්,
සමාදාන විනිශ්චයකාර.

1970 ක්වූ පෙබරවාරි මස 24 වෙනි දින,
රක්වාන සුළු නගර සභා කාර්යාලය,
රක්වාන.

## රක්වාන සුළු නගර සභාව

**68.12.31 වෙනි දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශය**

**බැරකම්**

| | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|
| තැන්පත් (සාමාන්‍ය) හා විදුලිය | | | 12,914 72 | |
| ර යේ ආධාර : | | | | |
| නිවාස යෝජනා ක්‍රමය | ... | 31 28 | | |
| ක්‍රීඩා භූමිය | ... | 685 0 | | |
| පුස්තකාලය | ... | 2,990 73 | | |
| මාර්ග සංවර්ධණය | ... | 3,278 75 | | |
| | | | 7,285 76 | |
| ණය—පුරහල | ... | | 17,500 0 | |
| | | | | 37,700 48 |
| විවිධ ණය හිමියෝ | ... | | | 20,615 79 |
| අධිකතා හා ඌණතා ගිණුම (සාමාන්‍ය) | | | | |
| 68.1.1 දිනට අධිකය | ... | | 67,209 17 | |
| 1968 වර්ෂයේ වියදම | ... | 77,733 93 | | |
| 1968 වර්ෂයේ ආදායම | ... | 71,009 31 | | |
| | | | 6,724 62 | |
| | | | | 60,484 55 |
| | | | | 118,800 82 |

**වත්කම්**

| | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|
| හිඟ ආදයම් : | | | | |
| දේපල බදු හිඟ | ... | | 3,558 69 | |
| වතුර බදු හිඟ | ... | | 1,704 14 | |
| කසළ බදු හිඟ | ... | | 2,845 38 | |
| වරිපනම් දඩ හිඟ | ... | | 192 33 | |
| විදුලිය ගාස්තු හිඟ | ... | | 5,866 94 | |
| කුලී හිඟ | ... | | 45 0 | |
| | | | | 14,212 48 |
| අත්තිකාරම | ... | | | 14,769 0 |
| විවිධ ණය ගැතියෝ | ... | | | 10,633 36 |
| ස්ථිර තැන්පත් : | | | | |
| ලං. ඉ. බැංකුව | ... | | 308 26 | |
| තැ. කා. ඉ. බැංකුව | ... | | 564 40 | |
| | | | | 872 66 |
| අධිකතා හා ඌනතා ගිණුම : (විදුලිය) | | | | |
| 1968.1.1 දිනට ඌනතාවය... | | | 47,739 18 | |
| 1968 වර්ෂයේ ගෙවීම් | ... | 51,757 54 | | |
| 1968 වර්ෂයේ ලැබීම් | ... | 50,703 79 | | |
| | | | 1,053 75 | |
| | | | | 48,792 93 |
| මුදල් ඉතිරිය | ... | | | 29,520 39 |
| | | | | 118,800 82 |

රක්වාන සුළු නගර සභාවේ සභාපති වේලාතන්තිරි ගුරුනාන්සේලාගේ කරුණාරත්න වන මම ඉහත සඳහන් ප්‍රකාශය මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1968 දෙසැම්බර් 31 වෙනි දිනට රක්වාන සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳව සත්‍යවූත් හා නිවැරැදිවූත් ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

වී. ටී. ජී. කරුණාරත්න,
රක්වාන සුළු නගර සභාවේ සභාපති.

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරැදි බවට සහතික කරමි.

කේ. ඩී. ඒඩින් අ.ප්පුහාමි,
අංක 3 කොට්ඨාශයේ නියෝජිත—රක්වාන සුළු නගර සභා .

1970 පෙබරවාරි මස 24 වෙනි දින රක්වානේදී මා ඉදිරිපිට අත්සන්කර දිවුරුම් දුන් බවට සහතික කරමි.

කේ. සබාරත්නම්,
සාමදාන විනිශ්චයකාර.

1970 ක්වූ පෙබරවාරි මස 24 වෙනි දින,
රක්වාන සුළු නගර සභා කාර්යාලය,
රක්වාන.

7–711—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## කොළොන්නාව නගර සභාව

**1965 දෙසැම්බර් 31 දිනට කොළොන්නාව නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳ වාර්තාව**

**බැරකම්**

| | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත් මුදල් | ... ... | | 1,75,202 19 |
| වියදම් නොවී ඉතුරුවී ඇති ආධාර මුදල් : | | | |
| ක්‍රීඩා භූමි | ... ... | 11,357 0 | |
| මතුපිට කාණු ක්‍රමය | ... ... | 3,77,285 0 | |
| මළ නාළිකා ක්‍රමය | ... ... | 3,30,000 0 | |
| පුස්තකාලය | ... ... | 11,500 0 | |
| ප්‍රජා මණ්ඩලය | ... ... | 835 0 | |
| | | | 7,30,977 0 |
| රජයෙන් ලබාගත් ණය මුදල් : | | | |
| ජල සම්පාදන ක්‍රමය | ... ... | 11,65,000 0 | |
| මතුපිට කාණු ක්‍රමය | ... ... | 96,975 0 | |
| | | | 12,61,975 0 |
| වට්නාකම අඩුවීම සඳහා වෙන් කළ මුදල්— විදුලි අංශය | ... ... | | 21,000 0 |
| 1965.1.1 දිනට අතිරික්තය | ... | 64,034 46 | |
| 1965.12.31 දිනට අතිරික්තය | ... | 9,317 81 | |
| | | | 73,352 27 |
| | | | 22,62,506 46 |

**වත්කම්**

| | | රු. ශ. |
|---|---|---|
| අත්තිකාරම් මුදල් | ... ... ... | 50,365 96 |
| ස්ථාවර තැන්පත් මුදල් | ... ... ... | 1,00,000 0 |
| මතුපිට කාණු ක්‍රමය සඳහා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතුමා ළඟ ඇති තැන්පත් මුදල් | ... ... | 2,77,285 0 |
| මළ නාළිකා ක්‍රමය සඳහා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතුමා ළඟ ඇති තැන්පත් මුදල් | ... ... | 2,70,000 0 |
| මළ නාළිකා ක්‍රමය සඳහා ඉඩම් ගැනීමට තැන්පත් කළ මුදල් | | 60,000 0 |
| ජල සම්පාදන ක්‍රමය සඳහා රජයේ වැඩ අධ්‍යක්ෂකතුමා ළඟ ඇති තැන්පත් මුදල් | ... ... ... | 11,65,000 0 |
| මුදල් පොතේ 1965.12.31 දිනට ඉතුරුව | ... ... | 3,39,855 50 |
| | | 22,62,506 46 |

කොළොන්නාව නගර සභාවේ සභාපති උඩුමුල්ලගේ දොන් මර්ලින් අබේසේකර වන මම, ඉහත සඳහන් 1965 දෙසැම්බර් 31 වෙනි දිනට දක්වෙන කොළොන්නාව නගර සභාවේ වත්කම් හා බැරකම් ප්‍රකාශනය මගේ උපරිම දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

යූ. ඩී. ඇම්. අබේසේකර,
සභාපති.

නගර සභා කාර්‍යාලය, කොළොන්නාව.

ඉහත සඳහන් ප්‍රකාශනය නිවැරදි බවට සහතික කරමි.

සෝමසිරි ගලගෙදර,
අංක 2 කොට්ඨාශයේ නියෝජිත.

1966 පෙබරවාරි 28 වෙනි දින මා ඉදිරිපිට දී සහතික කරන ලදී.

එච්. ඩී. ඩයමන් එදිරිසිංහ,
සමාදාන විනිශ්චයකාර තැන.

## කොළොන්නාව නගර සභාව

### 1965 වර්ෂයේ ලැබීම් හා ගෙවීම් වාර්තාව

**ආදායම**

| | රු. ශ. |
|---|---|
| ඒ.—පොදු ආදායම් ... ... ... | 6,40,992 37 |
| බී.—මාර්ග/පාරවල් ... ... ... | 4,470 44 |
| සී.—අම්බලම් හා තානායම් ... ... | — |
| ඩී.—සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි ... ... | 31,846 80 |
| ඊ.—මහජන සෞඛ්‍යය ... ... ... | 65,210 28 |
| එෆ්.—මහජන විනෝදය ... ... | 1,132 55 |
| ජී.—සුසාන භූමි ... ... ... | 648 50 |
| එච්.—සුනඛයින් ලියාපදිංචි කිරීම ... ... | 30 0 |
| අයි.—කිරුම් හා මිණුම් ගාස්තු ... ... | 588 10 |
| ජේ.—විදුලිබල දෙපාර්තමේන්තුව ... ... | 2,88,672 87 |
| කේ.—ගින්නෙන් ආරක්ෂාව ... ... | — |
| එම්.—කියවීම් ශාලා සහ පුස්තකාල ... ... | — |
| එකතුව ... | 10,33,591 91 |

**වියදම**

| | රු. ශ. |
|---|---|
| ඒ.—පොදු වියදම් ... ... ... | 1,32,050 87 |
| බී.—මාර්ග/පාරවල් ... ... ... | 1,16,690 92 |
| සී.—අම්බලම් හා තානායම් ... ... | — |
| ඩී.—සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි ... ... | 31,937 50 |
| ඊ.—මහජන සෞඛ්‍යය ... ... ... | 4,57,665 03 |
| එෆ්.—මහජන විනෝදය ... ... | 820 0 |
| ජී.—සුසාන භූමි ... ... ... | 6,245 78 |
| එච්.—සුනඛයින් ලියාපදිංචි කිරීම ... ... | — |
| අයි.—කිරුම් හා මිණුම් ගාස්තු ... ... | 161 96 |
| ජේ.—විදුලිබල දෙපාර්තමේන්තුව ... ... | 2,70,856 35 |
| අගය අඩු කිරීමට වෙන් කළ ගණන ... | 5,000 0 |
| කේ.—ගින්නෙන් ආරක්ෂාව ... ... | 54 0 |
| එම්.—කියවීම් ශාලා සහ පුස්තකාල ... ... | 2,791 69 |
| එකතුව ... | 10,24,274 10 |

**අනිකුත් ලැබීම් :**

| | |
|---|---|
| තැන්පත් මුදල් ... ... ... | 1,46,121 60 |
| අත්තිකාරම් මුදල් ... ... ... | 38,531 79 |
| වැඩිපුර ගෙවීම්වලින් ආපසු අයකරගත් මුදල් ... | 413 90 |
| අගය අඩු කිරීමට වෙන් කළ මුදල ... ... | 5,000 0 |
| පුස්තකාල ආධාර මුදල ... ... | 1,000 0 |
| 1965.1.1 දිනට ඉතිරි මුදල ... ... | 3,31,430 21 |
| මුළු එකතුව ... | 15,56,089 41 |

**අනිකුත් ගෙවීම් :**

| | |
|---|---|
| තැන්පත් මුදල් ... ... ... | 1,28,221 58 |
| අත්තිකාරම් මුදල් ... ... ... | 63,324 33 |
| වැඩිපුර ගෙවීම්වලින් ආපසු අයකරගත් මුදල් ... | 413 90 |
| 1965.12.31 දිනට ඉතිරි මුදල ... ... | 3,39,855 50 |
| මුළු එකතුව ... | 15,56,089 41 |

කොළොන්නාව නගර සභාවේ සභාපති උඩුමුල්ලගේ දොන් මර්ලින් අබේසේකර වන මම, මගේ උපරිම දැනුමේ හා විශ්වාසයේ හැටියට ඉහත දක්වෙන්නේ කොළොන්නාව නගර සභාවේ 1965 වර්ෂය තුළ ලබන ලද හා ගෙවන ලද සියලුම මුදල් පිළිබඳ සැබෑ හා නිවැරදි වාර්තාවක් බව මෙයින් සහතික කරමි.

යූ. ඩී. ඇම්. අබේසේකර,
සභාපති.

කොළොන්නාව නගර සභා කාර්යාලයය.

ඉහත සඳහන් ප්‍රකාශනය නිවැරදි බවට සහතික කරමි.

සෝමසිරි ගලගෙදර,
අංක 2 කොට්ඨාශයේ නියෝජිත.

1966 පෙබරවාරි මස 28 වෙනි දින කොළොන්නාවේදී මා ඉදිරිපිට දී සහතික කරන ලදී.

එච්. ඩී. ඩයමන් එදිරිසිංහ,
සමාදාන විනිශ්චයකාර තැන.

7-700—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## වත්තල-මාබෝලෙ නගරය

### 1968 වර්ෂයේ ආදායම් හා වියදම් දක්වෙන ප්‍රකාශනය

| ආදයම | රු. | ශ. |
| --- | --- | --- |
| ඒ.—සාමාන්‍ය ආදායම | 3,29,603 | 49 |
| බී.—පොදු මංමාවත් | 1,709 | 64 |
| සී.—තානායම් හා අම්බලම් | — | |
| ඩී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි | 15,220 | 13 |
| ඊ.—මහජන සුවය | 46,973 | 65 |
| ඇෆ්.—පොදු විනෝද කටයුතු | 40,790 | 80 |
| ජී.—සොහොන් බිම් | 215 | 25 |
| එච්.—බල්ලන් ලියාපදිංචි කිරීම | — | |
| අයි.—ත ාදි පඩි සහ සේරු | 466 | 55 |
| ජේ.—විදුලි දෙපාර්තමේන්තුව | 2,77,932 | 93 |
| කේ.—ගිනි නිවීමේ කටයුතු | — | |
| ඇල්.—පලතුරු ගස් සැපයීම | — | |
| ඇම්.—කියවීම් ශාලා | 1,075 | 0 |
| | 7,13,987 | 44 |
| **වෙනත් ආදයම්** | | |
| තැන්පත් මුදල් | 78,210 | 01 |
| අත්තිකාරම් | 50,364 | 33 |
| ක්ෂය සංචිතය | 2,000 | 0 |
| 67.12.31 දිනට ඉතිරි | 2,49,891 | 08 |
| | 10,94,452 | 86 |

| වියදම | රු. | ශ. |
| --- | --- | --- |
| ඒ.—සාමාන්‍ය වියදම | 1,23,499 | 36 |
| බී.—පොදු මංමාවත් | 28,434 | 10 |
| සී.—තානායම් හා අම්බලම් | — | |
| ඩී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි | 38,187 | 81 |
| ඊ.—මහජන සුවය | 1,73,286 | 74 |
| ඇෆ්.—පොදු විනෝද කටයුතු | 1,435 | 0 |
| ජී.—සොහොන් බිම් | 3,121 | 10 |
| එච්.—බල්ලන් ලියාපදිංචි කිරීම | 3 | 50 |
| අයි.—තරාදි පඩි සහ සේරු | — | |
| ජේ.—විදුලි දෙපාර්තමේන්තුව | 2,45,682 | 54 |
| කේ.—ගිනි නිවීමේ කටයුතු | — | |
| ඇල්.—පලතුරු ගස් සැපයීම | — | |
| ඇම්.—කියවීම් ශාලා | 9,759 | 28 |
| | 6,23,409 | 43 |
| **වෙනත් ගෙවීම්** | | |
| තැන්පත් මුදල් | 54,714 | 95 |
| අත්තිකාරම් | 1,41,679 | 54 |
| ක්ෂය සංචිතය (විදුලිය අංශය) | 2,000 | 0 |
| ස්ථිර තැන්පත් පොලී | 2,183 | 26 |
| 68.12.31 දිනට ඉතිරි | 2,70,465 | 68 |
| | 10,94,452 | 86 |

වත්තල-මාබෝලෙ නගරයේ විශෙෂ කොමසාරිස්, බර්ටි ලියනමාන වන මම මගේ දනීම හා විශ්වාසය පරිදි ඉහතින් දක්වා ඇති වත්තල-මාබෝලෙ නගරයේ 68.12.31 අවසන් වන වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනය සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

බර්ටි ලියනමාන,
විශෙෂ කොමසාරිස්,
වත්තල-මාබෝලෙ නගරය.

1969 පෙබරවාරි මස 28 වැනි දින,
විශෙෂ කොමසාරිස් කාර්යාලය,
වත්තල-මාබෝලෙ නගරය.

1969 පෙබරවාරි මස 28 වැනි දින දී මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ආර්. ඒ. ගුණවර්ධන,
සාමදාන විනිශ්චයකාර තැන.

## වත්තල-මාබෝලෙ නගරය

### 1968.12.31 වැනි දින දක්වා වූ වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

| බැරකම | රු. | ශ. | රු. | ශ. |
| --- | --- | --- | --- | --- |
| රතුකුරුස සමාජයේ අරමුදල | | | 274 | 50 |
| ක්ෂය සංචිතය | | | 33,695 | 08 |
| තැන්පත් | | | 1,59,419 | 64 |
| **රජයේ අධාර** | | | | |
| ඇවරිවත්ත නිවාස යෝජනා ක්‍රමය | | | 17,594 | 18 |
| මතුපිට කානු තැනීමේ යෝජනා ක්‍රමය | | | 88,900 | 0 |
| 1968 වර්ෂයේ ආදායම | 7,13,987 | 44 | | |
| 1968 වර්ෂයේ වියදම | 6,23,409 | 43 | | |
| 1968 වර්ෂයේ තිරික්තය | 90,578 | 01 | | |
| 1967.12.31 දින දක්වාවූ අතිරික්තය | 1,67,943 | 48 | | |
| 1968.12.31 දින දක්වා වූ අතිරික්තය | | | 2,58,521 | 49 |
| | | | 5,58,404 | 89 |

| වත්කම | රු. | ශ. | රු. | ශ. |
| --- | --- | --- | --- | --- |
| **අත්තිකාරම්** | | | | |
| (1) විදුලිය දෙපාර්තමේන්තුව | 29,580 | 43 | | |
| (2) සාමාන්‍ය අත්තිකාරම් මුදල | 1,08,126 | 30 | | |
| | | | 1,37,706 | 73 |
| පෝස්ට්මාස්ටර් ජනරාල් | | | 30 | 0 |
| ඉතිරි කිරීමේ බැංකු ගිණුම | | | 194 | 55 |
| තැපැල් ඉතිරි කිරීමේ බැංකු ගිණුම | | | 850 | 0 |
| **ස්ථාවර වත්කම්** | | | | |
| ඇවරිවත්ත නිවාස යෝජනා ක්‍රමය | 19,240 | 12 | | |
| මතුපිට කානු තැනීමේ යෝජනා ක්‍රමය | 97,450 | 70 | | |
| විදුලි යෝජනා ක්‍රමය | 32,467 | 11 | | |
| | | | 1,49,157 | 93 |
| බැංකුවේ සහ අතේ ඉතිරිය | | | 2,70,465 | 68 |
| | | | 5,58,404 | 89 |

වත්තල-මාබෝලෙ නගරයේ විශෙෂ කොමසාරිස්, බර්ටි ලියනමාන වන මම මගේ උපස්ම දනීම හා විශ්වාසය පරිදි ඉහතින් දක්වා ඇති වත්තල-මාබෝලෙ නගරයේ 1968.12.31 වැනි දිනට දක්වෙන බැ. කම් හා වත්කම් ප්‍රකාශනය සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

බර්ටි ලියනමාන,
විශෙෂ කොමසාරිස්,
වත්තල-මාබෝලෙ නගරය.

1969.2.28 වැනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ආර්. ඒ. ගුණවර්ධන,
සාමදාන විනිශ්චයකාර තැන.

7–688—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

# අය-වැය ලේඛන

## හැටන්-දික්ඔය නගර සභාව

### 1970 පළමුවැනි පරිපූරක අයවැය ලේඛනය

| වැය ශීර්ෂය | | රු. ශ. | යෝජනා අංකය |
|---|---|---|---|
| ඊ.—6 (බී) | නඩත්තු කිරීම (ආයුර්වේද බෙහෙත් හල්) ... | 2,597 37 | 1970.2.18 දින අංක 19 |
| ඩී.—2 | පාරවල් නඩත්තු කිරීම ... ... | 10,000 0 | 1970.6.18 දින අංක 14 |
| ඊ.—1 (බී) | දීමනා (මහජන සෞඛ්‍යය) ... ... | 2,000 0 | |
| ඊ.—2 (බී) | කරත්ත හා ලොරි ... ... | 25,000 0 | |
| ඊ.—3 (බී) | කරත්ත හා ලොරි ... ... | 4,500 0 | |
| ඊ.—5 (එෆ්) | (ඒ) ණය මුදල් (මුල් මුදල) ... ... | 8,150 0 | |
| ඊ.—5 (එෆ්) | (බී) ණය මුදල් (පොලී) ... ... | 13,100 0 | |
| | | 65,347 37 | |

ඉහත සඳහන් ප්‍රකාර සම්මත කර ගන්නා ලදී.

එම්. ජී. පී. ගුණවර්ධන,
හැටන්-දික්ඔය නගර සභාවේ සභාපති.

1970 ජූනි මස 30 වැනි දින, හැටන්,
හැටන්-දික්ඔය නගර සභා කාර්යාලයයේ දී ය.

7–689—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## කොල්දෙණිය නගරය

### දෙවැනි පරිපූරක අය වැය ලේඛනය—1970

| වැය ශීර්ෂය | යෝජිත වැය රු. ශ. |
|---|---|
| ඩී.—මහජන සෞඛ්‍ය :— | |
| 1. සාමාන්‍ය— | |
| (එච්) කානු බැඳීම ... ... ... | 2,000 0 |
| 2. කසල ශෝධනය— | |
| (බී) කරත්ත, ලොරි, ගොන් ... ... | 1,300 0 |
| 3. වැසිකිළි පවිත්‍ර කිරීම— | |
| (සී) ගබඩා ... ... ... | 1,000 0 |
| ඊ.—මහජන විනෝදය :— | |
| 2. නඩත්තු කිරීම ... ... ... | 4,000 0 |
| එකතුව ... | 8,300 0 |

## පලමුවැනි පරිපූරක අය වැය ලේඛනය—1970

### විදුලි අංශය

| | රු. ශ. |
|---|---|
| 6. දීර්ඝ කිරීම හා දියුනු කිරීම ... ... | 5,000 0 |
| එකතුව ... | 5,000 0 |

ලි. මු. සමරසිංහ,
විශේෂ කොමසාරිස්, තොල්දෙණිය නගරය.

විශේෂ කොමසාරිස් කාර්යාලය,
තොල්දෙණිය නගරය,
1970.6.30 වැනි දින.

7–695—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## මාවනැල්ල සුළු නගර සභාව

### 1970 වර්ෂයේ තෙවැනි අතිරේක අයවැය ලේඛණය (සාමාන්‍ය

| වැය ශීර්ෂය | මුදල රු. ශ. | යෝජනා අංකය හා දිනය |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම :— | | 19˙ මැයි මස 31 වෙනි දින අංක 6 (11) දරණ සභා සම්මතිය |
| (2) සංස්ථා වියදම්— | | |
| (ඈජ්) ලි ිද්‍රව්‍ය, මුද්‍රණ කටයුතු ආදිය ... ... | 3,500 0 | |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| (1) සාමාන්‍ය— | | |
| (ඒ) වේතන : | | |
| (1) සෞඛ්‍ය පරීක්ෂකයෝ ... ... ... | 1,000 0 | |
| (එච්) කානු ඉදි කිරීම ... ... ... | 2,600 0 | |

ජී. ඇල්. ඇම්. යුසුප්,
මාවනැල්ල සුළු නගර සභාවේ සභාපති.

1970.6.11 වෙනි දින,
මාවනැල්ල සුළු නගර සභා කායඕලයේදිය.

අනුමත කරමි.

ජේ. ජී. කීර්තිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්, කෑගල්ල.

1970 ජූලි මස 9 වැනි දින,
පළාත් පාලන අමාත්‍යාංශ කායඕලය, කෑගල්ල.

7–715—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## වෙයන්ගොඩ සුළු නගර සභාව

### 1970 දෙවන පරිපූරක අයවැය ලේඛනය

1 වන කොටස—සාමාන්‍ය

| | රු. ශ. |
|---|---|
| ඒ.—2 (ඒ) ගණන් පරීක්ෂා ගාස්තු ... ... | 3,630 75 |
| එකතුව ... | 3,630 75 |

1970 මැයි 16 වැනි දින පවත්වන ලද වෙයන්ගොඩ සුළු නගර සභාවේ මාසික සාමාන්‍ය සභා රැස්වීමේ යෝජනා අංක 10 අනුව සභා සම්මත විය.

ඒ.කේ. ආර්. පෙරේරා,
සභාපති,
වෙයන්ගොඩ සුළු නගර සභාව.

1970.7.8 දින,
වෙයන්ගොඩ සුළු නගර සභා කාර්යාලයේදී ය.

7–710—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## තිස්සමහාරාම සුළු නගර සභාව

**1970 අය වැය ලේඛනය**

### පළමුවෙනි පරිපූරක වැය ලේඛනය—1 වැනි කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂය | මුදල රු. ශ. | අනුමත කළ යෝජනා අංකය හා දිනය |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| (ඇඒ) විශ්‍රාම වැටුප් ... ... ... | 350 0 | යෝජනා අංකය 8 හා 1970.4.27 දිනය |
| (එච්) නිලඇඳුම් ... ... ... | 500 0 | |
| බී.—මංමාවත් :— | | |
| (12) නව කර්මාන්ත ... ... ... | 4,000 0 | |
| සී.—නගර සහා ඉඩම් හා ගොඩනැගිලි :— | | |
| (7) නව කර්මාන්ත ... ... ... | 5,000 0 | |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| (6) රෝහල් : | | |
| (ඒ) වැටුප් ... ... ... | 6,350 0 | |
| (බී) නඩත්තු ... ... ... | 3,500 0 | |
| (7) පොදු වෙළඳ පොලවල් හා ගාල් : | | |
| (ඒ) දෛනික වැටුප් ... ... ... | 1,800 0 | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල :— | | |
| (1) වේතන ... ... ... | 2,100 0 | |
| (2) දෛනික වැටුප් ... ... ... | 1,900 0 | |
| | 25,500 0 | |

### 2 වැනි කොටස—විදුලි අංශය

| | | |
|---|---|---|
| 4. පාලනය හා සාමාන්‍ය වියදම් :— | | |
| (බී) බාහිර සේවක වේතන හා දීමනා ... ... | 2,000 0 | |
| | 2,000 0 | |

මෙම වැය ශීර්ෂයන් ඉහත සඳහන් යෝජනාව යටතේ සම්මතවූ බැව් මෙයින් සහතික කරමි.

ජී. ටී. ආර්ලිස් සිල්වා,
තිස්සමහාරාම සුළු නගර සභාවේ සභාපති.

1970 මැයි මස 7 වෙනි දින,
සුළු නගර සභා කාර්යාලය,
තිස්සමහාරාම.

සංශෝධනය කර අනුමත කරමි.

පැරකුම් විජේසිංහ,
පලාත් පාලන සහකාර කොමසාරිස් හම්බන්තොට.

1970 ජුලි මස 2 වෙනි දින,
හම්බන්තොට පලාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

7–686—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

යොමු අංකය : **එම්ර්/ඩීසී/පීඑස් 47/61**

## වැල්ලවත්තේ ප්‍රෙඩරිකා පාර දීර්ඝ කිරීම

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 268 වන පරිච්ඡේදයේ 26 වැනි ඡේදය යටතේ පිළියෙල කරන ලද නිවැරදි කරනු ලැබූ, අවසාන වියදම කොටස් කිරීම**

1966.8.5 වැනි දින අංක 1,4707 දරණ ගැසට් පත්‍රයේ පළවූ 1966 ජුලි 19 වන දිනෙන් යුත් ගැසට් නිවේදනය මෙයින් අවලංගු කර එය නිවැරදි කරන ලදුව, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල නිවාස හා නගර සංවර්ධන ආඥා පණතේ 263 වන පරිච්ඡේදයේ 26(6) වැනි ඡේදය යටතේ, කොළඹ නාගරික සභාව එකී වැඩ නිම කිරීමෙන් පසුව කරන ලද වියදම කොටස් කිරීම මෙහි පහත පළවේ:—

| තක්සේරු අංකය | වීථියේ නාම | අයිතිකරුගේ නම සහ ලිපිනය | තැනීමේ වියදම රු. ශ. | ඉඩම අත්පත්කරගැනීමේ වියදම රු. ශ. | වියදම කොටස් කිරීම රු. ශ. |
|---|---|---|---|---|---|
| 23 ... | ප්‍රෙඩරිකා පාර ... | ජේම්ස් හෙන්රි වැලන්ටයින් සුද්දිරික්කු ජයවික්‍රම, 31 ප්‍රෙඩරිකා පාර | 1,643 31 ... | — ... | 1,643 31 |
| 27සහ 27 1/1 | එම ... | නො. 27, ප්‍රෙඩරිකා පාරෙහි යූ. ඊ. සහ ආර්. ඊ. බැස්ටියන්පිල්ලෙ | 2,054 13 ... | — ... | 2,054 13 |
| 29 ... | එම ... | ජෝස් රොසයිරෝ බ්‍රිටෝ මෝතා, 29, ප්‍රෙඩරිකා පාර ... | 2,115 76 ... | — ... | 2,115 76 |
| 31සහ31 1/1 | එම ... | ජේම්ස් හෙන්රි වැලන්ටයින් සුද්දිරික්කු ජයවික්‍රම, 31 ප්‍රෙඩරිකා පාර | 3,450 94 ... | — ... | 3,450 94 |
| 24/1 ... | එම ... | අබ්දුල් හුසේන් ඩවුඩබායි, 50, වෙල්ල වීදිය, කොළඹ 12 ... | 9,017 64 ... | 7,500 0 ... | 1,517 64 |
| | | | 18,281 78 | 7,500 0 | 10,781 78 |

ඕ. ඒ. ජයසිංහ,
නාගරික කොමසාරිස්.

නගර ශාලාව,
කොළඹ 7,
70.6.30.

7–681—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

මගේ අංකය : එම්ඊ/ඩීසි/පීඑස්/83/61

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 268 පරිච්ඡේදයේ 26 වන ඡේදය යටතේ පිළියෙල කරන ලද අවසාන වියදම කොටස්කිරීම පාමංකඩ පටුමඟ ඔබ්බෙහි පුද්ගලික වීථිය තැනීම

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ (268 වන පරිච්ඡේදය) 26(6) වන ඡේදය යටතේ අංක 13,309 සහ 21.9.19 ි දින දරණ ලක් රජයේ ගැසට් පතේ පලකරනු ලැබූ නිවේදනයට අමතරව කොළඹ නාගරික සභාව එකී පාර තැනීමෙන් පසුව ඒ පිළිබඳව අවසාන වියදම කොටස් කිරීම මෙහි පහත දනුම් දෙනු ලැබේ.

| තක්සේරු අංකය | වීථියේ නම | අයිතිකරුගේ නම සහ ලිපිනය | තැනීමේ වියදම රු. ශ. | මලනාලිකා තැනීමේ වියදම රු. ශ. | වියදම කොටස් කිරීම රු. ශ. |
|---|---|---|---|---|---|
| 19 | පාමංකඩ පටුමඟ | කේ. සම්බන්ධසර්, මයා., බී. සම්බන්ධසර් මිය සහ ජේ. මුතු ලිංගස්වාමි මෙනෙවිය යන අය අංක 19 පාමංකඩ පටුමඟ කොළඹ 6 | 1,838 40 | 2,111 09 | 3,949 49 |
| 29 | එම | බී. ඒ. රත්නසිංහම් මහතා සහ බී. රත්නසිංහම් මහත්මිය 29, පාමංකඩ පටුමඟ, කොළඹ 6 | 1,868 29 | 1,362 0 | 3,230 29 |
| 33 | එම | හියුබට් විලියම් බෝයගොඩ, 33, පාමංකඩ පටුමඟ කොළඹ 6 | 1,629 14 | 1,259 84 | 2,888 98 |
| 37 | එම | කේ. නාකලිංගම් මයා., සහ එස්. නිලෙයිලිංගම් මහත්මිය යන අය. 37, පාමංකඩ පටුමඟ, කොළඹ 6 | 1,928 07 | 1,225 80 | 3,153 87 |
| 37/1 | එම | කේ. නාකලිංගම් මයා, 37, පාමංකඩ පටුමග, කොළඹ 6 | 1,016 35 | 953 40 | 1,969 75 |
| 37/2, 37/2ඒ. | එම | වී. චන්මුගම් බාරේ ජේ. ෂන්මුගනාතන් මහත්මිය 37/2ඒ, පාමංකඩ පටුමඟ, කොළඹ 6 | 1,076 13 | 816 20 | 1,892 33 |
| 39 | එම | දොස්තර ජේ. මහේශ්‌ ්‌රම් මහත්මිය, 39 පාමංකඩ පටුමඟ, කොළඹ 6 | 1,943 01 | 1,225 80 | 3,168 81 |
| 41 | එම | එස්. නඩරාසා මයා., 41 පාමංකඩ ප . මඟ, කොළඹ 6 | 2,884 01 | 1,225 8ා | 3,168 81 |
| 43 | එම | ඊ. පී. වෙල්ලයියා මයා, 30, පාමංකඩ පටුමග කොළඹ ා | 1,449 7ා | 749 10 | 2,198 89 |
| 45 | එම | එම | 1,494 63 | 749 10 | 2,243 73 |
| 53 | එම | එම්. නමසිවායම් මයා, 53, පාමංකඩ පටුමඟ කොළඹ 6 | 1,853 34 | 1,770 59 | 3,623 93 |
| 57 | එම | දොස්තර එස්. චිත්සභාසන් මහතා, සී. සිවනාතර් මයා භාරේ සිවසුද්ධාරාම, පාර ඔබ්බෙ අංක 25, ගොරකගහ පෙදෙස, කොළඹ 6 | 1,748 72 | 1,498 20 | 3,246 92 |
| 61 | එම | කේ. අනන්තන් මයා, 23, හැම්ඩන් පෙදෙස, කොළඹ 6 | 1,883 23 | 1,498 20 | 3,381 43 |
| 73වත්ත | එම | ඒ. එම්. ප්‍රනාන්දු මෙනෙවිය 100, හයි ්‍ලීට්, කොළඹ 6, එස්. ඊ. ප්‍රනාන්දු මයා, 73/1 පාමංකඩ පටුමඟ කොළඹ 6, ජී. එප්. පී. විතාන 73/8 පාමංකඩ පටුමඟ කොළඹ 6, මාරි රීටා සෙල්වරානි පිලිප්ස් මිය, 73/7 පාමංකඩ පටුමඟ කොළඹ 6 සහ ප්‍රින්සස් මාරි, තෙරේස් සන්නම්බල් ක්‍රිෂ්ණපිල්ලෙයි මෙනෙවිය, ශාන්ත අන්තෝනි කන්‍යාරාමය, 82, කනත්තපාර කොළඹ 8 | 7,174 20 | — | 7,174 20 |
| 73/10 | එම | ජේ. ජස්ටින් මහතා, 73/10, පාමංකඩ පටුමඟ, කොළඹ 6 | 2,391 40 | 4,017 89 | 6,409 29 |
| 77 | එම | එච්. එස්. දංදෙනිය මයා, 77 පාමංකඩ පටුමඟ, කොළඹ 6 | 6,262 48 | 5,277 74 | 11,540 22 |
| 83 | එම | ජී. පී. ජී. එප්. ආර්. සිරිවර්දන මයා, 83/1, පාමංකඩ පටුමඟ, කොළඹ 6 | 2,690 33 | 3,881 69 | 6,572 02 |
| 85 | එම | කේ. ඒ. ඉලියස් මහත්මිය, 22, ප්‍රැන්ක්පට් පෙදෙස, කොළඹ 4 | 4,424 09 | 1,498 20 | 5,9ට2 29 |
| 87/1 | එම | ආර්. ජේ. කණකා මිය, 87/1, පාමංකඩ පටුමඟ, කොළඹ 6 | 3,283 18 | 2,826 14 | 6,114 32 |
| 87/2 | එම | එම්. පී. ඩී. කුරේ මයා, වලාන, පානදු | 911 73 | 1.464 14 | 2 375 87 |
| 87/3 | එම | සී. බාලසිංහම් මයා 53, පාමංකඩ පටුමඟ, කොළඹ 6, වී. සුන්දර ලිංගම් මයා, 29 හැමර්ස් පෙදෙස, කොළඹ 6 | 2,062 58 | 1,362 0 | 3,424 58 |
| 89 | එම | ඒ. තෝමස් කොවූර් මයා, 89 පාමංකඩ පටුමඟ කොළඹ 6 | 4,618 39 | 1,430 10 | 6,048 49 |
| 30/1 | එම | ඊ. පී. වෙල්ලයියා මයා.,30, පාමංකඩ පටුමඟ කොළඹ 6, සිරිල් රාජපක්ෂ මයා., කන්නාඩි වෙළඳකැන, ඉහල වැකැම්වීදිය, කොළඹ 1, සී. පී. එම්. රාජපක්ෂ මහත්මිය, 34/ඒ, පාමංකඩ පටුමඟ, කොළඹ 6 ටී. සෝමසේකරම් මයා. 34 පාමංකඩ පටුමඟ කොළඹ 6 | 8,818 29 | 5,720 39 | 14,538 68 |
| 30 | එම | ඊ. පී. වෙල්ලයියා මයා. 30 පාමංකඩ පටුමඟ, කොළඹ 6 සහ ටී. සෝමසේකරම් මයා 34, පාමංකඩ පටුමඟ කොළඹ 6 | 3,333 02 | — | 3,333 02 |
| 36 | එම | දොස්තර ටී. ෂන්මුගනාතන් මයා අයියනාර් කෝවිල් පාර, වන්නාර් පනායි, යාපනය | 4,648 29 | 1,566 29 | 6,214 58 |
| 40, 40 1/1, 40½, 44 | එම | කේ. වී. පසුපති මයා 40½, පාමංකඩ පටුමඟ, කොළඹ 6 | 3,407 75 | 2,077 04 | 5,484 79 |
| 48 | එම | ඊ. කන්දයියා මයා. 48, පාමංකඩ පටුමඟ, කොළඹ 6 | 5,679 5ා | 2,179 19 | 7,858 77 |
| 50 | එම | එන්. ඒ. ඩී. වීරසිංහ මයා. 4ා පාමකඩ පටුමඟ, කොළඹ 6 | 4,528 72 | 1,532 24 | 6,060 96 |
| 54 | එම | ඒ. සිවපාතසුන්දරම් මිය. 54, පාමංකඩ පටුමඟ, කොළඹ 6 | 2,182 15 | 1,498 20 | 3,680 35 |
| 56 | එම | වී. ගුණරත්නම් මයා. 56, පාමංකඩ පටුමඟ, කොළඹ 6 | 2,241 94 | 1,566 29 | 3,808 23 |
| 58 | එම | ඒ. සෙල්වනායගම් මයා. 58, පාමංකඩ පටුමඟ, කොළඹ 6 | 4,708 07 | 1,498 20 | 6,206 27 |
| | | | 95,984 92 | 56,113 26 | 1,52,098 18 |

නගර ශාලාව,
කොළඹ 7
1970.7.6

බී. ඒ. ජයසිංහ,
නාගරික කොමසාරිස්.

7—699—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## වැලිගම නගර සභාව

### ජල භීතිකා රෝගය

වැලිගම නගර සීමාව තුළ ජල භීතිකා රෝග උවදුර පවතින බැවින්, එම නගර සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන, දඬුවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියක) මාවිසින් ලියවිල්ලකින් බලය පවරනු ලබනු අයකු විසින් එවේලෙහිම විනාශ කරනු ලබන බව, (ලංකාවේ ව්‍යවස්ථාපිතප්‍රඥප්ති සංග්‍රහයේ 476 වැනි පරිච්ඡේදය වන) ජල භීතිකා ආඥාපනතේ දෙවන වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශය 1970 ජූලි මස 4 වෙනි දින සිට හය මාසයක් වලංගු වන්නේ ය.

හෙන්රි දළුවත්ත,
සභාපති,
නගර සභාව, වැලිගම.

1970 ජූලි මස 4 දින,
වැලිගම නගර සභා කාර්යාලයේදීය.

7–696—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## අම්බලන්තොට සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනත

මෙහි පහත දක්වෙන උප ලේඛණයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයේ 1970 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්ලා අයදුම් පත් මා වෙත ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පණතේ 272 වැනි පරිච්ඡෙදයේ 7 වැනි වගන්තිය මෙයින් දනුම් දෙමි.

එහි බලපත්‍රය නිකුත් කිරීම ගැන අම්බලන්තොට සුළු නගර සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එය කුමණ කරුණක් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් එකක් සහිතව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම් කරන ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ටී. ඇන්. ජේ. බහමන් | ... මැලේකොළණිය, මුස්ලිම් පල්ලිය අසල | ... හරක් මස් |

කේ. සමරරත්න,
සභාපති,
අම්බලන්තොට සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලයය, අම්බලන්තොට,
1970.7.8.

7–714—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයේ මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1970 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලා අයදුම්පතක් මාවෙත ඉදිරිපත් කර තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 7 (2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන අරණායක ගම්සභාව සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධවීමට හේතු සඳහන් පිටපත් දෙකකකින් යුත් ලියවිල්ලක්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුළත මාවෙත එවියයුතු බව මෙයින් දැනුම්දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳමේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| ආනා අබ්දුල් අසීස්, දිප්පිටිය, අරණායක. | ... එල හරක් මස් | ... දිප්පිටියේ අංක 414 දරන ස්ථානය |

ඇන්. ඒ. පී. ගුණරත්න,
අරණායක ගම්සභාවේ සභාපති.

ගම්සභා කායර්ාලය,
අරණායක.
1970.7.7 දින.

7–709—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව

### ජල භීතිකා රෝගය

නාවලපිටිය පළාත් ආණ්ඩු සභා සීමාව තුළ ජල භීතිකා රෝග උවදුර පවතින බැවින් එම පළාත් ආණ්ඩු සභා සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ස්ථානයක හෝ පාරක හමුවන දඬුවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසි යම් සුනඛයෙකු (බල්ලකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවේලෙහිම විනාශ කරනු ලබන බව (476 වැනි අධිකාරය වන) ජල භීතිකා ආඥාපනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

මෙහි සඳහන් දිනයේ සිට හය මසක් ගතවූ පසු, මෙම නිවේදනය අවලංගු වන්නේ ය.

එච්. ඇම්. ඇල්. බදුර්දීන්,
සභාපති,
නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභාව,
නාවලපිටිය,
1970 ජූලි මස 6 දින.

7–704—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩපලාත ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් අය විසින් 1970 වර්ෂයේ දී මස් පිණිස සතුන් මරා, මස් විකිණීම පිණිස බලපත්‍රයක් ඉල්ලා අයැදුම් පතක් මාවෙත ඉදිරිපත් කර ඇති බව 262 වැනි අධිකාරය වන ගෝඝාතක ආඥාපණතේ 7 (2) වන වගන්තිය ප්‍රකාර මෙයින් දනුම් දෙමි.

මෙම බලපත්‍රය 1970 ජූලි මස 1 වැනි දින සිට 1970 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා නිකුත් කිරීම ගැන, උඩපලාත ගම්සභාව සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමණ හේතුන් නිසා ද යන වග සඳහන් කර පිටපත් දෙකකින් යුක්ත ලියවිල්ලක් මෙම දන්වීම, ගැසට් පත්‍රයේ පල වූ දින සිට දින 14 ඇතුලත දී මා වෙත ලියා එවීමට බලය තිබෙන බව මහජනයා වෙත මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| අයදුම් කරුගේ නම සහ ලිපිනය | ව්‍යාපාරය | ස්ථානය |
|---|---|---|
| 1. කේ. බාවා මහතා, රාගල, හල්ග්‍රන්ඔය ... | ... හරක් මස් වෙළඳාම | ... නො. 31/8, රාගල කඩ වීදිය, හල්ග්‍රන්ඔය, |

සුනිල් කුමාරදස,
සභාපති,
උඩපලාත, ගම්සභාව.

ගම්සභා කාර්යාලය,
රාගල, හල්ග්‍රන්ඔය
25.6.70.

7–693—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## වැල්ලවාය ගම්සභාව

මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ගම්සභාව විසින් වර්ෂ 1970 ජූනි මස 27 වෙනි දින පවත්වනලද ගම්සභාවේ මාසික රැස්වීමේදී මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කරගත්බව මහජනයා වෙත මෙයින් දැනුම්දෙනු ලැබේ.

ඩී. ඇම්. පුන්චිබණ්ඩා,
වැල්ලවාය ගම්සභාවේ සභාපති තැන.

1970.6.27 වන දින,
වැල්ලවාය ගම්සභා කායඝාලයේදීය.

### යෝජනාව

"වැල්ලවාය ගම්සභාව මගින් එම ගම්සභා සීමාව තුල පිහිටි පොදු ළිං වශයෙන් 1963 ජූනි මස 28 වෙනි දින අංක 13,688 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ 4 වන කොටසේ ප්‍රසිද්ධියට පමුණුවා ඇති අංක 1 සිට 12 දක්වා වූ ළිං වලට අමතරව, වැල්ලවාය ගම්සභා සීමාව තුල පිහිටි මහජනයා පොදු වශයෙන් පාවිච්චි කරන පහත දක්වෙන ළිං මින් ඉදිරියට වැල්ලවාය ගම්සභාව සතු බව ප්‍රදේශයේ මහජනයාගේ දැනගැණීම සඳහා රජයේ ගැසට් පත්‍රයේ පලකරවා ගත යුතුයයි'' ගම්සභා නියෝජිත ඩබ්ලිව්. තෙන්නකෝන් මහතා විසින් කරන ලද යෝජනාව ගම්සභා නියෝජිත අයි. ඩබ්ලිව්. ඇම්. අබේරත්න මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

| අංකය | | කොට්ඨාශ අංකය | | ළිඳේ නම |
|---|---|---|---|---|
| 13 | ... | කුරුගම අංක 2 රංදෙනිය | ... | බලේවෙල ළිඳ |
| 14 | ... | තෙලුල්ල අංක 5 ඇතිලිවැව | ... | වෙහෙරයායේ ළිඳ |
| 15 | ... | තෙලුල්ල අංක 5 ඇතිලිවැව | ... | පරණ ඇතිලිවැව ළිඳ |
| 16 | ... | තෙලුල්ල අංක 1 බලහරුව | ... | බලහරුව ළිඳ(අංක 2) |
| 17 | ... | කොටිකන්බොක්ක අංක 2 දිමුලාමුරේ | ... | පේරකැටිය ළිඳ |
| 18 | ... | කොටිකන්බොක්ක අංක 2 දිමුලාමුරේ | ... | රදපොලගම ළිඳ |
| 19 | ... | කොටිකන්බොක්ක අංක 3 හීනපහුව | ... | හිඟුරේගල ළිඳ |
| 20 | ... | කුරුගම අංක 2 රංදෙනිය | ... | සියඹලාගුනේ ළිඳ |
| 21 | ... | තෙලුල්ල අංක 1 බලහරුව | ... | බලහරුව ළිඳ (අංක3) |

7—691—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## ගලහිටියාව ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත උප ලේඛණයෙහි දක්වෙන අය විසින් 1970 වර්ෂයට මස් කඩයක් පවත්වා ගෙනයාමට බලපත්‍ර ඉල්ලුම්කර සි න බවත් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන ගලහිටියාව ගම්සභා සීමාව තුල යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දින සිට දින 14ක් ඇතුලතදී මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපණතේ 272 වැනි පරිච්ඡෙදයේ 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | | වෙළඳාම | | පිහිටි ස්ථානය |
|---|---|---|---|---|
| 1. පී. ඩී. රිච්ඩ | ... ... | එළහරක් මස් | ... | මාකෝවිට මංසන්දියේ |

ඇස්. නෙල්සන් ද සිල්වා ගුණසේකර,
ගලහිටියාව ගම්සභාවේ සභාපති.

1 70 ජූලි මස 5 වැනි දින,
ගම්සභා කාර්යාලය,
ගල..ටියාව, ගණේමුල්ල.

7– 90—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

---

## 1951 අංක 6 දරණ පළාත් පාලන ආයතන "පොදු අතුරු ව්‍යවස්ථා" පනත (261 වැනි අධිකාරය)

පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා" පනතේ 3 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ බෙම්මුල්ල ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මතකර ගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන ඇමතිතුමා විසින් සම්මත කරනු ලැබ 1953 අප්‍රේල් 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වාවූ කාණ්ඩද, 1963 ජූනි 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1965 ජනවාරි 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පමුණුවනු ලැබූවාවූද, එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ අංක 38 දරණ කාණ්ඩයද, 1966 ජූලි 8 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1969 ජනවාරි 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පමුණුවනු ලැබූවාවූද, එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ 39, 40, සහ 41 වන කාණ්ඩද මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මත කර ගැනීමට කොළඹ දිස්ත්‍රික්කයේ බෙම්මුල්ල ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා" පනතේ 261 වැනි අධිකාරිය 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඩී. ඒ. දිසානායක,
බෙම්මුල්ල ගම්සභාවේ සභාපති.

1970 ජූනි 30,
බෙම්මුල්ල ගම්සභා කායඝාලය,
වටද්දර,
වේයන්ගොඩ.

## 5 (2) 2—පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා

පළාත් පාලන ඇමතිතුමා විසින් සම්මත කරනු ලැබ, 1953 අප්‍රේල් 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරනු ලද්දාවූද, පොදු අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වාවූ කාණ්ඩද, 1953 ජූනි 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ, 1965 ජනවාරි 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පමුණුවනු ලැබූවාවූද, එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ අංක 38 දරණ කාණ්ඩයද, 1966 ජූලි 8 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ, 1969 ජනවාරි 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පමුණුවනු ලැබූවාවූද, එකී අතුරු ව්‍යවස්ථා මාලවේ අංක 39, 40 සහ 41 වැනි කාණ්ඩද මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මතකර ගැනීමට කොළඹ දිස්ත්‍රික්කයේ බෙම්මුල්ල ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන පොදු අතුරු ව්‍යවස්ථා පනතේ 261 වැනි අධිකාරියේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ, යනුවෙන්වූ ඩබ්. පී. ඩී. සී. වීරවර්ධන මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මතවූයේ ආර්. ඒ. ජයතිලක මහතාගේ ස්ථිරත්වයෙනි.

ඉහතින් දැක්වූයේ 1970. 4. 27 වැනි දින පැවැත්වුණු මාසික රැස්වීමේදී සභා සම්මත කර ගැණුනු අංක 5 (2) 2 දරණ යෝජනාවේ සත්‍ය පිටපතකි.

ඇල්වින් දිසානායක,
බෙම්මුල්ල ගම්සභාවේ සභාපති.

1970. 6. 21 වැනි දින,
ගම්සභා කායඝාලය,
වටද්දර, වේයන්ගොඩ.

7–682—70.7.17 දින අංක 14,915 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | ... 70. 6. 5 සිකුරාද | ... 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | ... 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | ... 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | ... 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | ... 70. 7. 2 බ්‍රහස්පතින්ද | ... 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | ... 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | ... 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | ... 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | ... 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | ... 70. 8. 7 සිකුරාද | ... 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | ... 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | ... 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | ... 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | ... 70. 9. 4 සිකුරාද | ... 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | ... 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | ... 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | ... 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... 70.10. 2 සිකුරාද | ... 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | ... 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | ... 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | ... 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | ... 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | ... 70.11. 5 බ්‍රහස්පතින්ද | ... 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | ... 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | ... 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | ... 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | ... 70.12. 4 සිකුරාද | ... 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | ... 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | ... 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | ... 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | ... 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී